# දැන්වීමයි

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව -උතුරු මැද පළාත
## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ
## තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම. (විවෘත) – 2025

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.10.25** වන අතර බඳවා ගැනීමේ තරඟ විභාගය 2025 **නොවැම්බර්** මස අනුරාධපුර නගරයේදී පැවැත්වීමට නියමිත වේ.

| අංකය | තනතුර | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කාර්මික නිලධාරි (සිවිල්) | - III ශ්‍රේණිය | 58 |
| 2 | කාර්මික නිලධාරි(යාන්ත්‍රික) | - III ශ්‍රේණිය | 01 |
| 3 | කාර්මික නිලධාරි(විදුලි) | - III ශ්‍රේණිය | 01 |
| 4 | ප්‍රමාණ සමීක්ෂක | - III ශ්‍රේණිය | 01 |
| 5 | සැලසුම් ශිල්පි | - III ශ්‍රේණිය | 10 |

**02**. තනතුරකට බඳවා ගැනීමේ පුරප්පාඩු ප්‍රමාණය අමාත්‍ය මණ්ඩල තීරණ අංක /25/1421/802/004 –VIII හා 2025.08.11 අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

### **03**. බඳවා ගැනීමේ සුදුසුකම්:

3.1 **පොදු සුදුසුකම්**

3.1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.1.2. සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම සුදුසු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

3.1.3. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය

3.1.4. අයදුම්කරු උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතුය.(ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද DS-4 පදිංචි සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. කලත්‍රයාගේ ස්ථිර පදිංචිය වුවද සලකා බැලේ)

**3.2 කාර්මික නිලධාරී III ශ්‍රේණිය - (සිවිල්, යාන්ත්‍රික, විදුලි, ප්‍රමාණ සමීක්ෂක, සැලසුම් ශිල්පි)**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

- ව්‍යවහාර ගණිතය/ශුද්ධ ගණිතය/ සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව/ඉංජිනේරු තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහිතව අ.පො.ස. (උ.පෙළ) විද්‍යා/ගණිත තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකින් එකවර සමත්වීම.

  සහ

- භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) , විද්‍යාව,ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් 06කින් එකවර අධ්‍යයන පොදු සහතික පත්‍ර(සා.පෙළ) සමත් වීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්**

**1.කාර්මික නිලධාරි III ශ්‍රේණිය (සිවිල්, යාන්ත්‍රික, විදුලි, ප්‍රමාණ සමීක්ෂක, සැලසුම් ශිල්පි)**

I.මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III.අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සදහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සදහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම

**3.3 පුහුණු කිරීමේ ශ්‍රේණිය - සිවිල් (එක් වසරක පුහුණුව)**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ)විභාගය එකවර සමත් වීම.

සහ

භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) , විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්**

ඉහත සදහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සදහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් ( සිවිල්) සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම.

හෝ

II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සදහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සදහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික (සිවිල්) සුදුසුකම් ලබා තිබීම.

**04. බඳවා ගැනීමේ ක්‍රමය :**

4.1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේදී ලිඛිත තරග විභාගයක සහ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

4.1.2. කාර්මික නිලධාරී (සිවිල්) පමණක් III ශ්‍රේණියට බඳවා ගැනීමේදී ඉහත සඳහන් ආකාරයේ සුදුසුකම් ලබන ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විට ඉතිරි පුරප්පාඩු සදහා පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ. විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර ,සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

4.1.3 කුසලතා අනුපිළිවළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම් ලත් අපේක්ෂයන් සිටී නම් හා එම පුරප්පාඩු පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම් එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිපුර තෝරා ගැනීමක් සිදු කිරීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

## 4.3. ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

## 4.4. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ හැකියාව ,කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.සියළුම තනතුරු සඳහා වන අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | (අ) උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියේ /පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා<br>මෙහිදී සිවිල් නිලධාරියකුට තිබිය යුතු දැනුම පරික්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු ,මාර්ග තැනීම හා නඩත්තුව,ජල සම්පාදන හා ජල ප්‍රවාහන සම්බන්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>(ආ) උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික)III ශ්‍රේණියේ තනතුරු සඳහා<br>මෙහිදී යාන්ත්‍රික නිලධාරියකුට තිබිය යුතු දැනුම පරික්ෂා කිරීම සඳහා යාන්ත්‍රික තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>(ඇ) උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (විදුලි ) III ශ්‍රේණියේ තනතුරු සඳහා<br>මෙහිදී විදුලි නිලධාරියකුට තිබිය යුතු දැනුම පරික්ෂා කිරීම සඳහා විදුලි තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>(ඈ) උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පි IIIශ්‍රේණියේ තනතුරු සඳහා අපේක්ෂකයින් බඳවා ගැනීමට තනතුරුට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>(ඉ) උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ප්‍රමාණ සමීක්ෂක IIIශ්‍රේණියේ තනතුරු සඳහා<br>මෙහිදී ප්‍රමාණ සමීක්ෂක නිලධාරියකුට තිබිය යුතු දැනුම පරික්ෂා කිරීම සඳහා ප්‍රමාණ සමීක්ෂක තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වලින් සමන්විත වේ. |

**4.5.** ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවයේ අනුපිළිවල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**4.6.** ඉහත තාක්ෂණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතුය.

**4.7**. සම්මුඛ පරීක්ෂණය පත්වීම් බලධරයා විසින් පවත්වනු ලබන අතර ,මෙම පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර,සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදුකෙරේ.

**4.8 එක් අවුරුදු පුහුණු කාල සීමාව අවසානයේ දී ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීම**

**4.8.1.** පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **කොමිෂන් සභා ලේකම් විසින්** නම් කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**4.8.2.** පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත්වන ආධුනිකයින් වෙතොත් ඔවුන්ට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත.එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත්වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

## 05. මාසික වැටුප් පරිමාණය හෝ දීමනාව:

**තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු වලට හිමි වැටුප් පරිමාණය :**

**5.1.**අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙ හි උපලේඛන III ශ්‍රේණියේ තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය, රු.52,250-800x10-1,190x11-1,320x10-1,350-රු.100,040/-(MN – 3 2025)වේ.

මෙයට අමතරව රජයේ නිලධාරීන්ට රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද මෙම තනතුර දරන්නාට හිමි වනු ඇත.

**5.2.**පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු කාලය තුළ ඉහත කී ,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි උපලේඛන VI අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

## 06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

**6.1** උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III ශ්‍රේණියේ තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරනයන්ට යටත්ව)

**6.2.** උතුරු මැද පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III ශ්‍රේණියේ පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, රා.ප.ච.18/2020 හා ඊට ආනුශාංගික චක්‍රෙල්ඛ අනුව තනතුරට බැඳී වසර 3ක් ඉකුත්වීමට පෙර පත්වීම ස්ථිර කිරීමට අදාළ චක්‍රෙල්ඛ විධිවිධාන සපුරාලිය යුතුය.

## 07. විභාගය පැවැත්වෙන මාධ්‍ය :

මෙම විභාගය සිංහල , දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුනෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ ක්‍රමය :

**8.1**. A4 (සෙ.මී.21X25)ප්‍රමාණ පත්‍රයක දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කළ යුතු අතර ,ශීර්ෂ අංක 01 සිට 3 තෙක් පළමු පිටුවටද 4 සිට 6 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස සකස් කර අදාළ තොරතුරු පැහැදිළිව ඇතුළත් කළයුතු වේ.

**8.2.** නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන,අසම්පූර්ණ හා ඉහත අංක 03 අනුව සුදුසුකම් නොමැති,නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8.3.**ඉල්ලුම්පතෙහි ඡායා පිටපත් භාරගනු නොලැබේ.(ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) විභාගයට අදාළ වන ප්‍රවේශපත්‍ර ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්කරුවන් වෙත යවනු ලැබේ.විභාග ප්‍රවේශපත්‍ර එවීම තුළින් ඔබගේ සුදුසුකම් සනාථ කළ බව සැලකිල්ලට නොගත යුතුය.

**8.4.** විභාග ගාස්තු උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් උතුරු මැද පළාත් සභාවේ අංක: 2003.02.13 අය ශීර්ෂයට බැර වන පරිදි රු.720/-ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද (NC –100) ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත තීරුවේ නොගැලවෙන ලෙස අලවා තිබිය යුතුය.(ලදුපතේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)කිසිම හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවන ලබන බවත් එම ගාස්තුව වෙනත් විභාගයට මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිල්ලට ගත යුතුය.

**8.5**. ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ/දිවුරුම් කොමසාරිස් වරයෙකු /නීතිඥවරයෙකු / පොලිස් සේවයේ මාණ්ඩලික ස්ථිර තනතුරක් දරණ නිලධරයෙකු /රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ 2025.01.01 දිනට රු.59,228/- කට නොඅඩු මාසික වැටුපක් ලබන මාණ්ඩලික නිලධාරියක් විසින් සහතික කරනු ලැබිය යුතුය.

**8.6.** රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**8.7**. නිවැරදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.10.28 දිනට පෙර **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ,දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රය,උතුරු මැද පළාත,අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.ඉල්ලුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු මැද පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ...................තනතුර සඳහා බඳවා ගැනීම - 2025"** ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

**8.8.** තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

**9. විභාගයට පෙනී සිටීම:**

**9.1** විභාගය පැවැත්වීමට අවම වශයෙන් සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යොමු කරනු ඇත. ප්‍රවේශපත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේපත්‍ර ඉදිරිපත් කල යුතුය.ප්‍රවේශපත් නොලද අපේක්ෂකයන් වෙතොත් ඒ බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ මුදල් ගෙවූ එන්සී 100 කුවිතාන්සියේ සහතික කළ පිටපතක්ද අයදුම්පත්‍රය, ලියාපදිංචි කළ කුවිතාන්සියද සමඟ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.විභාගයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

1.පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2.වලංගු විදේශ ගමන් බලපත්‍රය
3.වලංගු රියදුරු බලපත්‍රය

**9.2** මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරියේ පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.විභාගය පවත්වන දිනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරි කාලයේදී දැනුම් දෙනු ඇත.සියලුම අයදුම්කරුවන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

**9.3** විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති රීතිවලට විභාග අපේක්ෂකයා යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පනවනු ලබන දඬුවමකට යටත්වීමට එම අයට සිදු වනු ඇත.

**9.4** මෙම තනතුරු පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීම දැන්වීමෙන් අනාවරණය නොවන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳව තීරණ ගැනීමේ බලය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. තවද මෙහි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි .

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2025.09.25

# ආදර්ශ අයදුම්පත්‍රය
## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා
## බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල - S, දෙමළ - T ඉංග්‍රීසි - E)

(සංකේතය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන තනතුර : අංකය :

(**01.**කාර්මික නිලධාරී (සිවිල්) - **02.**කාර්මික නිලධාරී (යාන්ත්‍රික) – **03.**කාර්මික නිලධාරී (විදුලි) – **04.** ප්‍රමාණ සමීක්ෂක – **05.**සැලසුම් ශිල්පි; අදාළ තනතුර හා අංකය කොටුව මත ලියන්න.)

පදිංචි දිස්ත්‍රික්කය :

**1.** 1.1 මුලකුරු සමඟ නම :
.....................................................................................................................................................
Mr. /Mrs. /Miss ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 මුලකුරු සමඟ නම :
.....................................................................................................................................................
.....................................................................................................................................
මයා / මිය / මෙනවිය (සිංහලෙන් / දෙමළෙන්)

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................

1.4 මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/ දෙමළෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................

**2.** 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................

2.2ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................

2.3දැනට රාජ්‍ය සේවයේ නිරත අයෙකු නම් කාර්යාල ලිපිනය :
.....................................................................................................................................................
.....................................................................................................................................

**3.** 3.1 උපන් දිනය : වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (.......... . ) වයස අවු : ........... මාස : ......... දින : ...............

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 [ ] පුරුෂ - 0 [ ]

(අදාළ කොටුව තුළ √ යොදන්න)

**4.** ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර

4.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : .....................................................................

| ඡන්ද නාම ලේඛනයට අනුව පදිංචිය | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙළ අංකය | | | |

**5** අධ්‍යාපන සුදුසුකම් (නිවේදනයේ 3:2ට අනුව) :

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය (සහතික ඡායා පිටපත් අමුණන්න)

වර්ෂය ......................... විභාග අංකය ..........................................

| **විෂයය** | **සාමාර්ථය** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**5.2** අ.පො.ස. (උ.පෙළ) විභාගය (සහතික ඡායා පිටපත් අමුණන්න)

වර්ෂය ......................... විභාග අංකය ............................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

**6.** තාක්ෂණ සුදුසුකම්

(සහතික ඡායා පිටපත් අමුණන්න)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකයේ අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

**7**. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු:

**i.** විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම : ..............................................................

**ii.** දිනය : ...................................................................

**iii.** කුවිතාන්සි අංකය : ...................................................................

මුදල් ගෙවා ලබාගත් ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

**8.අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

දිනය ......................................

...............................
අයදුම්කරුගේ අත්සන

**9.අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................ මහතා / මහත්මිය /මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු /ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය .......................................

....................................
සහතික කරන්නාගේ අත්සන
(රබර් මුද්‍රාව)

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..........................................................................

තනතුර : ..........................................................................

ලිපිනය : ..........................................................................

**10.** රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන .......................................................................... මහතා / මහත්මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................................ වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු / ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි බවත් සහතික කරමි.

දිනය .......................................

..................................................
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව සහිතව)